

පාලන තන්ත්‍ර වෙනසකට එහා ගිය අරගලය

පසුවිපරමක් !

අතිපූජ්‍ය ආචාර්ය ඕමල්පේ සෝභිත හිමිගෙන් පැහැදිලි කිරීමක්

ජුලි 13, 2022 කථානායක නිල නිවසේ ආන්දෝලනාත්මක හමුවීම්

ඉන්දීය-ඇමෙරිකානු සැලසුම් වෙනස් කරමින් රනිල් ජනාධිපති කළ යාපා

ජවිපෙ-ජාජබට අවස්ථාවක්

කාටත් අමතක මහකොමසාරිස් බැග්ලේගේ පොරොන්දුව

ශ්‍රී ලංකා දේශපාලනය උඩුයටිකුරු කළ 2022 'අරගලය' ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිසරය ඇති කිරීමට මහාසංඝරත්නය භූමියේ කළ මැදිහත්වීම පිළිබඳව අතිපූජ්‍ය ආචාර්ය ඕමල්පේ සෝභිත හිමියන් පසුගියදා පැහැදිලි කිරීමක් කළේය. අතිශය තීරණාත්මක 2019 නොවැම්බර් පැවැත්වූ ජනාධිපතිවරණය ජයග්‍රහණය කර රටේ 8 වැනි ජනාධිපතිවරයා ලෙස අනුරාධපුරයේ රුවන්මැලි සෑය අභියස දිවුරුම් දුන් ගෝඨාභය රාජපක්ෂ තම ධුරයෙන් ඉවත් නොවී රටින් පිටවීම අතිශය බරපතල අර්බුදකාරී තත්ත්වයක් බව අවධාරණය කළ උන්වහන්සේ ඒ අවස්ථාවේදී (2022 ජූලි 13) තමන් කථානායක මහින්ද යාපා අබේවර්ධනගෙන් රටේ පාලනය භාර ගැනීමට කියා ඉල්ලා සිටීමට පෙළඹුණ බව ප්‍රකාශ කළේය. එම යෝජනාව තමන් වහන්සේ තනියෙන් ඉදිරිපත් නොකළ බවත් එය කණ්ඩායමක් ලෙස ගනු ලැබූ ක්‍රියාමාර්ගයක් බවත් අවධාරණය කළේය.

'අහස' නාලිකාවේ 'සංවාදය' වැඩසටහනට මෑතකදී සහභාගි වෙමින් ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ උත්තරීතර සංඝ සභාවේ අතිපූජ්‍ය ආචාර්ය සෝභිත හිමියන් එම පැහැදිලි කිරීම කළේ එවකට කථානායක ජනාධිපති ධුරය භාර ගැනීමට කතෝලික පියතුමන් ඇතුළුව කණ්ඩායමක සාමාජිකයකු ලෙස තමන් වහන්සේ කථානායක නිල නිවාසයට වැඩම කළාදැයි ඇසුව ප්‍රශ්නයට පිළිතුරු ලෙසය. ඊට අදාළ අනෙක් ප්‍රශ්නය වූයේ සෝභිත ස්වාමීන්වහන්සේ ඇතුළු කණ්ඩායම කථානායකවරයා මුණගැසුණේ එවකට ඉන්දීය මහකොමසාරිස් වූ ගෝපාල් බැග්ලේ කථානායකවරයා හමුවූ දිනයේදීම ද? බැග්ලේ 2023 දෙසැම්බර් මාසයේදී තම කොළඹ සේවා කාලය නිම කළ අතර ඔස්ට්‍රේලියාවේ ඉන්දීය මහකොමසාරිස් ලෙස වැඩ භාරගනු ලැබීය.

කණ්ඩායමක් ලෙස ඒ අවස්ථාවේදී කළ මැදිහත්වීම කථානායකවරයාට පෞද්ගලික බලය පැවරීමක් කිරීමට ගනු ලැබූ ක්‍රියා මාර්ගයක් නොවන බව උන්වහන්සේ අවධාරණය කළේය. බීජ පැළ කිරීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීමට නැතහොත් 'සම බිමක්' ඇතිකිරීමට සතා, සර්පයා සහ අපද්‍රව්‍ය ඉවත් කිරීමට මැදිහත් වූ බව ප්‍රකාශ කළ උන්වහන්සේ 'අරගලය' සංවිධානාත්මක වැඩපිළිවෙළක් නොවන බවද ප්‍රකාශ කළේය.

තම කණ්ඩායම කළ මැදිහත් වීම හේතුවෙන් 'අරගලයට' නව මුහුණුවරක් ලැබුණ බවත් රට තුළ ඇතිවීමට ගිය විනාශකාරී තත්ත්වයක් වැළැක්වුණ බවත් උන්වහන්සේ අවධාරණය කළේය. එලෙසම යම් පක්ෂයක් හෝ කණ්ඩායමක් බලයට ගෙන ඒම ඉලක්ක කර ක්‍රියාත්මක නොවුණ බවත් අවධාරණය කළේය.

මෙම ලියුම්කරු පළමු ප්‍රශ්නය ඉදිරිපත් කළ අවස්ථාවේ දී සෝභිත ස්වාමීන්වහන්සේ 'අරගලයේ' පොදු අරමුණු සහ ක්‍රියාකාරකම් පිළිබඳව ප්‍රාමාණික සාකච්ඡාවක දී මෙය පුංචි, වැදගත් නොවන ප්‍රශ්නයක් බව සඳහන් කළේය. එදා උද්ගත වූ තත්ත්වය තුළ සෝභිත ස්වාමීන්වහන්සේ නියෝජනය කළ කණ්ඩායම රටේ ස්ථාවරත්වය ඇතිකිරීමට කටයුතු කළ බව අවධාරණය විය.

ජාතික හෙළ උරුමය හරහා සංඝයා වහන්සේ 2004 දී පක්ෂ දේශපාලනයට අවතීර්ණවීම, නම දෙනකුගෙන් සමන්විත වූ එම මන්ත්‍රී කණ්ඩායමෙන් ජාතික ලැයිස්තු ධුර සාමාජික සෝභිත හිමියන් 2007 ජනවාරි ඉල්ලා අස්වීම, එම පුරප්පාඩුව පාඨලී චම්පික රණවක විසින් පිරවීම, භික්ෂු පක්ෂ දේශපාලනය, ගලගොඩඅත්තේ ඥානසාර ස්වාමීන් වහන්සේ පිළිබඳව ඇතිවී තිබෙන තත්ත්වය ඇතුළු කරුණු කාරණා ගණනාවක් මෙම සාකච්ඡාවේදී අවධානයට ලක්විය.

මීට වසර පහකට පෙර සිදු වූ ආණ්ඩු පෙරළිය සම්බන්ධයෙන් ජාතික නිදහස් පෙරමුණ නායක විමල් වීරවංශ, සම්මානනීය කර්තෘ සේන තෝරදෙණිය, විශ්‍රාමික මේජර් ජෙනරාල් කේ. බී. එගොඩවෙලෙ (ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ ඉහළ කාර්ය මණ්ඩලයේ සේවය කළ), මහින්ද සිරිවර්ධන ('අරගලය' සමයේ මුදල් අමාත්‍යාංශයේ සහ මහා භාණ්ඩාගාරයේ ලේකම්), මොහාන් සමරනායක (ජනාධිපති මාධ්‍ය අංශයේ ප්‍රධානි/රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රධානි) සහ මහාචාර්ය සුනන්ද මද්දුම බණ්ඩාර (රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයාගේ මාධ්‍ය උපදේශක) සහ අසංග අබේගුණසේකර (භූ දේශපාලන විචාරක) කෘති පාඨකයින්ට දායාද කළේය. බලයෙන් පහකළ ගෝඨාභය රාජපක්ෂ ද තමන් මුහුණ දුන් අභියෝගය සම්බන්ධයෙන් කෘතියක් එළි දැක්වූයේය.

පළමු කෘතිය වූයේ එවකට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ (පොහොට්ටු පක්ෂය) නියෝජනය කළ පාර්ලිමේන්තු මන්ත්‍රී වීරවංශ යි. ඒ 2023 අප්‍රේල් අගය. නමුත් ඉන්දියානු මහ කොමසාරිස් ගෝපාල් බැග්ලේ සහ සෝභිත ස්වාමීන්වහන්සේ ඇතුළු කණ්ඩායමක් වෙන වෙනම බත්තරමුල්ලේ රජමල්වත්ත පිහිටි කථානායක නිල නිවසේදී හමුවීම පිළිබඳව සුනන්ද මද්දුම බණ්ඩාර හෙළිදරව් කළේ 2025 නොවැම්බර් මාසයේ අගදීය. ඊට පෙර ඒ සම්බන්ධයෙන් අවධානය යොමුවී තිබුණේ නැත.

ඔහුගේ 'අරගලයේ බලය: ගෝඨාභය නෙරපීමේ සිට රනිල් සිරගත කිරීම දක්වා' කෘතිය පිළිගැන්වූයේ හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහට ය. ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාට ද ආරාධනා කර තිබූ නමුත් ඔහු සහභාගි නොවීය. නමුත් හිටපු කථානායක අබේවර්ධන ඊට සහභාගි විය.

ගෝඨාභය ජනාධිපතිවරයා ඉලක්ක කර ක්‍රියාත්මක කළ මෙහෙයුමේ සුවිශේෂ කාර්යක් එවකට කොළඹ සිටි ඇමෙරිකානු තානාපතිවරිය වූ ජූලි චංග් කළ බව කිසිදු සැකයක් නැත. ශ්‍රී ලංකා නීතිඥ සංගමයට ද තීරණාත්මක වගකීමක් පැවරී තිබිණි. නීතිඥ සංගමය ද තම කාර්යභාරය ඉහළින්ම කළේය. ඇමෙරිකානු මැදිහත්වීම දකුණු කොරියානු සම්භවයක් ඇති චංග් ඇමෙරිකානු උපායමාර්ගික සැලසුම අපූරුවට ක්‍රියාත්මක කළේය. ජනාධිපති ධුරය භාර ගැනීමට කථානායක නිලනිවසේදී අබේවර්ධනට බලපෑම් කළ රාජ්‍යතාන්ත්‍රිකයා චංග් චෝදනාවට ලක්විය. වීරවංශ කළ චෝදනාව ඇමෙරිකානු තානාපතිවරිය වහාම ප්‍රතික්ෂේප කළේය.

සුනන්ද මද්දුම බණ්ඩාර බැග්ලේ සම්බන්ධව ආන්දෝලනාත්මක හෙළිදරව්ව කරන තුරු ජනාධිපති ධුරය අබේවර්ධන කථානායකවරයාට පිරිනැමීමට ඉන්දියාව කළ සෘජු මැදිහත්වීම රහසක් විය.

මහාචාර්යවරයාට තොරතුරු සැපයුවන් අතර හිටපු කථානායකවරයා ද වන බව රහසක් නොවේ. ගෝඨාභය රාජපක්ෂ බලයෙන් පහකිරීම ඒකාබද්ධ ඇමෙරිකානු-ඉන්දීය මෙහෙයුමක් විය. ඒ පිළිබඳව කිසිදු සැකයක් නොමැත.

ඇමෙරිකානු, ඇමෙරිකානු -ඉන්දීය උපායමාර්ගික සැලසුම අනුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කළ සභ එයින් පිටත කණ්ඩායම් ක්‍රියාත්මක වූ බව රහසක් නොවේ. තමන්ගේ ඉල්ලා අස්වීමෙන් ඇතිවන ජනාධිපති පුරප්පාඩුව පිරවීමට ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ තේරීම වූ රනිල් වික්‍රමසිංහද එම උපාය මාර්ගික සැලසුමේ කොටස්කරුවෙකි. ඔවුන්ගේ සැලසුම් අනුව ශ්‍රී ලංකාවේ ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වූයේ ලිබියන් පන්නයේ අන්තර්වාර ආණ්ඩුවකි. එහි ප්‍රධානියා ලෙස ඔවුන්ගේ තෝරාගැනීම වූයේ රටේ තුන්වන පුරවැසියා වූ කථානායක අබේවර්ධනය. එජාප නායක වික්‍රමසිංහ ඔවුන්ගේ තෝරාග ැනීම නොවීය. ගෝඨාභය ජනාධිපතිවරයා වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයාව එම ධුරයෙන් පහකිරීමට එකඟ නොවීම 'අරගලය' සැලසුම් කළ කණ්ඩායම මුහුණ දුන් හිමාලිය අභියෝගයක් විය. ගෝඨාභය රාජපක්ෂ එවැනි ස්ථාවරයක් ගැනීම පිළිබඳව ඔවුන් පුදුම නොවීය.

නමුත් දේශපාලන බලය වෙනුවෙන් ඕනෑම දෙයක් කිරීමට දෙවරක් නොසිතන මහජන නියෝජිතයින් සිටින රටක කථානායක අබේවර්ධන කිසිදු උපදෙසක් නොපතා තමන්ට බන්දේසියක තබා පිරිනැමූ ජනාධිපති ධුරය ප්‍රතික්ෂේප කළේය. එකවරක් නොව දෙවරක් ප්‍රතික්ෂේප කළේය. අබේවර්ධන බලයට කෑදර වූවා නම් ඒ අවස්ථාවේදී කටු ඔටුන්නක් වන ජනාධිපති ධුරය බාර ගන්නවා නොඅනුමානය. ඉන්දියාව කළ දැඩි බලපෑමට අබේවර්ධන යටත් නොවීය. ඇත්ත වශයෙන්ම ශ්‍රී ලංකාව දිර්ඝකාලීන දේශපාලන අස්ථාවරභාවයකින් සහ විනාශයකින් බේරා ගත් පුද්ගලයා අබේවර්ධනය. ඊට නිසි ගෞරවයක් ඔහුට ලැබුණේ නැත.

ඉන්දීය මහකොමසාරිස්වරයා සහ ඊට සුළු වෙලාවකට පසුව සෝභිත හිමි ඇතුළු පිරිස රජමල්වත්තේ කථානායක නිල නිවාසයට පැමිණෙන අවස්ථාවේදී පිරිසක් කලහකාරී ලෙස උද්ඝෝෂණය කරමින් සිටියේය. නමුත් ඔවුන්ට අවහිරතාවයකින් තොරව කථානායක නිල නිවාසයට ඒමට අවස්ථාව තිබිණි. පවතින ව්‍යවස්ථාව යටතේ වැඩබලන ජනාධිපතිවරයා ලෙස කටයුතු කිරීමට හෝ ජනාධිපති ධුරයේ වගකීම් ඉටුකිරීමට තමන්ට නොහැකි බව කථානායකවරයා අවධාරණය කළත් බැග්ලේ තම ස්ථාවරය වෙනස් නොකළේය. කථානායකවරයා මහාචාර්ය සුනන්ද මද්දුම බණ්ඩාර හට එදා සිදු වූ දේ හෙළිදරව් නොකළා නම් පහත සඳහන් ආන්දෝලනාත්මක ප්‍රකාශය සදාකාලික රහසක් වීමට ඉඩ තිබිණි.

ඉන්දීය රාජ්‍ය තාන්ත්‍රිකයා කථානායකවරයාට දුන් පොරොන්දුව කර්තෘවරයා අවධාරණය කර තිබිණි. "ඉතා ඉක්මනින් මහින්ද යාපාගේ තීරණය බලාපොරොත්තු වන බවද ජනාධිපති තනතුර භාර ගන්නා බවට කිසිවෙකුට එවැනි පොරොන්දුවක් විශ්වාසයෙන් දිය නොහැක.

ඉන්දීය මහ කොමසාරිස්වරයා පිටත්ව යෑමෙන් පසුව පැමිණි කණ්ඩායමට සෝභිත ස්වාමීන්වහන්සේ, කොළඹ විශ්වවිද්‍යාලයේ මහාචාර්ය අගලකඩ සිරිසුමන හිමි, සෞඛ්‍ය සේවා වෘත්තීය සමිති නායකයකු වූ රවි කුමුදේශ් සහ කතෝලික පියතුමන්ලා කිහිප දෙනකු අයත් විය.

තමන්ගේ කැඳවීමක් නොමැතිව පොලිස් විශේෂ කාර්ය බලකායේ කණ්ඩායමක් නිල නිවසේ ස්ථානගත කිරීම ද කථානායකවරයාට ප්‍රශ්නයක් වූ බව කර්තෘවරයා සඳහන් කර ඇත. නමුත් ආන්දෝලනාත්මක වන්නේ කථානායකවරයා එම කණ්ඩායම කැඳවීම ඉන්දීය මහකොමසාරිස්වරයාගේ මැදිහත්වීමෙන් සිදු වූ බවට සැක පහළ කිරීමයි.

අද වනතුරු 2022 සිදුවීම් පිළිබඳව පූර්ණ විමර්ශනයක් සිදු කළේ නැත. කෙසේ වෙතත්, අබේවර්ධන කථානායකවරයා ලෙස ජනාධිපති ධුරය ව්‍යවස්ථාවෙන් පිට භාර ගැනීමට වහාම එකඟ වූවා නම් භූමියේ තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස් වෙන බව කිව යුතුය. එදා ජවිපෙ පාර්ලිමේන්තුව අල්ලා ගැනීමට උත්සහයක් දැරීම පිළිබඳව පුදුම විය යුතු නැත. විදේශ මැදිහත්වීමෙන් ක්‍රියාත්මක වූ සැලසුම් අනුව ගෝඨාභය ඉවත් කර බලය වහාම ජවිපෙ අතට පත් කිරීමට එකඟතාවයක් නොවීය. ඔවුන්ට අවශ්‍ය වූයේ අබේවර්ධන කථානායකවරයා යටතේ අන්තර් වාර පාලනයකි. ඒ සැලසුම් අනුව වික්‍රමසිංහට අවස්ථාවක් නොවීය. ව්‍යවස්ථානුකූලව වික්‍රමසිංහට අග්‍රාමාත්‍ය ධුරයේ සිට ජනාධිපති ධුරයට පත්වීමට 2022 ජූලි 21 නොහැකි වූවා නම් නියමිත පරිදි 2024 සැප්තැම්බර් 21 ජනාධිපතිවරණය පැවැත්වෙන්නේ නැත.

හිටපු අමාත්‍ය වීරවංශ තම ඃසැඟවුණ කතාව කෘතියේ කථානායකවරයා ජනාධිපති කිරීමට ක්‍රියාත්මක කළ සැලසුම 'ප්ලෑන් ඒ' ලෙස නම් කර ඇත. තෝරදෙණියගේ කෘතිය අනුවද කථානායකවරයා ජනාධිපති කිරීම සමස්ත ව්‍යාපෘතියේ මූලික අංගයක් විය. එම ව්‍යාපෘතියේ කුටප්‍රාප්තිය වූයේ කථානායක ජනාධිපති කරවීමයි. කථානායකවරයා සුනන්ද මද්දුම බණ්ඩාර හරහා 2022 ජූලි 13 සිද්ධීන් හෙළිදරව් කිරීම තුළින් පාලන තන්ත්‍රය වෙනස් කිරීමේ මෙහෙයුම පිළිබඳව පූර්ණ දැනුවත් වීමක් ලබා ගැනීමට හැකිවිය. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා ඉවත් කිරීමේ ක්‍රියාවලියට ඉන්දියාව සහ ඇමෙරිකාව ඒකාබද්ධ ක්‍රියා මාර්ගයක් ගැනීම හුදකලා සිදුවීමක් නොවේ. ඊට මැතිසබය නියෝජනය කරන /නොකරන සැම පක්ෂයක්ම, මහා සංඝරත්නය, කතෝලික පල්ලිය, මුස්ලිම් ප්‍රජාව, නීතිඥ සංගමය, දෙමළ ඩයස්පෝරාව, සිවිල් සංවිධාන සහ මාධ්‍ය අඩු වැඩි වශයෙන් දායක විය.

නමුත් අරගල භූමියේ බලය සතු වූ කණ්ඩායම් විය. ඔවුන්ගෙන් කොටසක් 'ප්ලෑන් ඒ' සමග විය. ඊට පරිබාහිරව ක්‍රියාත්මක වූ පක්ෂ සහ කණ්ඩායම් ද විය. අරලියගහ මන්දිරයේ මහින්ද රාජපක්ෂ අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් මැයි 9 වන දින පැවැත්වූ රැස්වීමකට සහභාගි වූ පිරිසක් ගාලු මුවදොර අරගල භූමියේ සිටි පිරිස්වලට පහර දීමෙන් පසුව එම ස්ථානයට පැමිණි සජබ නායක සජිත් ප්‍රේමදාස අරගලකරුවන් අතින් මරුමුවට පත්වීමට ඉඩ තිබිණි. විපක්ෂ නායකවරයා ඒ වනවිට ක්‍රියාත්මක මෙහෙයුම නිවැරදිව තේරුම් ගත්තා නම් ඔහු කිසිසේත්ම ගාලු මුවදොර අරගල භූමියට ඇතුළු වන්නේ නැත.

මහින්ද යාපා අබේවර්ධන 2024 මාර්තු 21 වන දින තමන්ට එරෙහි තුන්දින විශ්වාසභංගය අවසානයේ ඡන්දය ගැනීමට පෙර කළ අතිශය ආන්දෝලනාත්මක ප්‍රකාශය සෑම පක්ෂයක්ම නොසලකා හැරියේය.

විදේශීය මැදිහත්වීම සම්බන්ධයෙන් සෘජු ප්‍රකාශයක් කළ කථානායකවරයා තමනට මරණ තර්ජන එල්ලවූ බව අවධාරණය කළේය. මීට පෙර කිසිදු අවස්ථාවක රටේ තුන්වන පුරවැසියා වන කථානායකවරයා එවැනි ප්‍රකාශයක් කර නැත. කිසිදු දේශපාලන පක්ෂයක්, ආගමික නායකයින්, සිවිල් සංවිධාන හෝ රට පිළිබඳව කිඹුල් කඳුළු හෙළන කිසිවකු කථානායකවරයා කළ ප්‍රකාශය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් ඉල්ලා සිටියේ නැත.

ඒ පිළිබඳව පරීක්ෂණයක් සිදුකළ යුතු නොවේදැයි මෙම ලියුම්කරු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ නායකත්වයෙන් මාධ්‍ය හමුවකදී විමසූ අවස්ථාවේදී එම ආයතනයේ සභාපති විශ්‍රාමික විනිසුරු එල්.ටී. බී. දෙහිදෙනිය අවධාරණය කළේ එවැනි ක්‍රියා මාර්ගයක් ගැනීමට නම් තමන්ට පැමිණිල්ලක් ලැබිය යුතු බවයි. කථානායක අබේවර්ධනටද ප්‍රශ්නය ඉදිරියට ගෙන යෑමට අවශ්‍ය නොවීය. ඒ වනවිට ඔහු වික්‍රමසිංහ ජනාධිපතිවරයාගේ කණ්ඩායමේ සාමාජිකයකු වී සිටි අතර එම තත්ත්වය තවදුරටත් අවධාරණය කරමින් 2024 නොවැම්බර් පැවැත්වූ මහා මැතිවරණයේදී අබේවර්ධන වික්‍රමසිංහ නායකත්වය දුන් නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ ජාතික ලැයිස්තුවට ඇතුළු විය.

විදේශීය බලවේගවල මැදිහත්වීමෙන් ජනාධිපති ධුරය හිමිකර ගැනීමට තිබූ අවස්ථාව ප්‍රතික්ෂේප කළ අබේවර්ධනට 29 දෙනකුගෙන් සමන්විත එම පෙරමුණේ ජාතික ලැයිස්තුවේ පස්වෙනි ස්ථානය හිමිවිය. වික්‍රමසිංහ ජනාධිපතිවරයාගේ සමයේ අග්‍රාමාත්‍ය ධුරය දැරූ දිනේෂ් ගුණවර්ධන, ශාමිලා පෙරේරා, ෆයිසර් මුස්තාපා සහ ටිරාන් අලස් පිළිවෙළින් අබේවර්ධනට ඉහළින් විය. ගෑස් සිලින්ඩරය ලාංඡනය යටතේ තරග කළ නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණට ආසන 5 ලැබිණි. ඒ අතර ජාතික ලැයිස්තු ආසන දෙකක් විය. ඒ ආසන ෆයිසර් මුස්තාපාට සහ රවී කරුණානායකට හිමිවිය. වර්තමාන දේශපාලන වාතාවරණය තුළ මහින්ද යාපා අබේවර්ධනට, 81, නැවත පාර්ලිමේන්තුට යෑමට අවස්ථාවක් නැත.

ශ්‍රී ලංකාවේ (2022 මාර්තු-ජූලි), බංගලිදේශයේ (2024 ජූලි-අගෝස්තු) සහ නේපාලයේ (2025 සැප්තැම්බර්) හිෂණකාරී තත්ත්වයන් තුළ සිදුකළ ආණ්ඩු පලවා හැරීම් දැඩි ජාත්‍යන්තර අවධානයට ලක්විය. විදේශීය මැදිහත්වීම් නොසලකා ඒ පිළිබඳව සාකච්ඡා කළ නොහැක. බලයෙන් පහකළ බංග්ලාදේශයේ ෂෙයික් හසීනා අග්‍රාමාත්‍යවරිය 2024 ආණ්ඩු පෙරළිය ඇමෙරිකානු මෙහෙයුමක් ලෙස නම් කළේය. බෙංගාල බොක්කේ පිහිටි බංගලිදේශයට අයත් ශාන්ත මාර්ටින් දූපත ඇමෙරිකානු ගුවන් හමුදා කඳවුරක් ස්ථාපිත කිරීමට ඉඩ නොදීම ඊට හේතුවූ බව ඇය ප්‍රකාශ කළ බව අද බොහෝ දෙනකුට අමතකය.

විදේශීය මැදිහත් වීම් සිදුවන්නේ යම් රටක දේශපාලන යාන්ත්‍රණය තුළ බව අවධාරණය කළ යුතුය. ලෝක පූජිත විශ්‍රාමික පකිස්තානු ක්‍රිකට් ක්‍රීඩකයකු වූ ඉම්රාන් ඛාන් 2022 අප්‍රේල් දෙවන සතියේ දී අග්‍රාමාත්‍ය ධුරයෙන් ඉවත් කිරීම ඊට දිය හැකි ප්‍රබල උදාහරණයකි. පාකිස්තානු අග්‍රාමාත්‍යවරයා ඉවත් කිරීම ඇමෙරිකාව විසින් එම රටේ පාර්ලිමේන්තුව හරහා ක්‍රියාත්මක කළ දුෂ්ට කුමන්ත්‍රණයක් බව හෙළිදරව් වී ඇත. ඊට ආසන්නම හේතුව වූයේ ඇමෙරිකානු විරෝධතාවය නොතකා පාකිස්තානු අග්‍රාමාත්‍යවරයා රුසියාවේ රාජ්‍ය සංචාරයක දීමයි. රුසියානු හමුදා 2022 පෙබරවාරි මාසයේ යුක්‍රේනය ආක්‍රමණය කිරීමෙන් පසුව ඛාන් ජනාධිපති පුටින් මොස්කව් හි හමුවීම ඇමෙරිකානු මැදිහත්වීමට හේතුවිය.

ශ්‍රී ලංකාවේ ආණ්ඩු පෙරළිය සම්බන්ධයෙන් අසංග අබේගුණසේකරගේ 'Winds of Change (Geopolitics at the Crossroads of South and Southeast Asia' ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති ධුරයෙන් ඉවත් කිරීමට ඇමෙරිකාව සෘජුව සම්බන්ධ වූ අයුරු අවධාරණය කළ ඇත. එය ක්‍රියාත්මක කළ ආයතනය මධ්‍යම බුද්ධි ඒජන්සිය (Central Intelligence Agency) ලෙස නම්කර ඇත. තවමත් ඇමෙරිකානු සම්බන්ධතා ඇති එක්සත් ජනපද ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනය (USAID) ව්‍යාපෘතිවලට සම්බන්ධ වී ඇති අබේගුණසේකර ගේ කෘතියේ සිංහල පරිවර්තනයක් හෙට (9) එළිදැක්වීමට නියමිතය. ලෝක සහ කලාපීය භූ දේශපාලනය තුළ ශ්‍රී ලංකාවේ 2022 ඇති කළ තත්ත්වය පිළිබඳව දැනුවත්වීමට මාධව වික්‍රමසිංහ කළ සිංහල පරිවර්තනය උපකාරී වනු ඇත.

● **ශමින්ද ෆර්ඩිනැන්ඩු**

වාර්තා 30ක් සමග යෞවන ක්‍රීඩා පිටිය උණුසුම් වෙයි.....

ගම්පහටත් මහනුවරටත් සම ශූරතා - නව වාර්තා 30ක් බිහිවෙයි...

යෞවන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා, ජවය සහ අධිෂ්ඨානය මැනවින් විදහා දැක්වුණු 36 වැනි ජාතික යෞවන ක්‍රීඩා උළෙලේ සමස්ත සම ශූරතාව ගම්පහ සහ මහනුවර දිස්ත්‍රික්ක විසින් දිනාගනු ලැබීය. දෙදිනක් පුරා දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණයේදී පැවැති මෙම ක්‍රීඩා උළෙලේදී දිස්ත්‍රික්ක දෙකම ලකුණු 130 බැගින් ලබාගනිමින් සම ශූරතා කිරුළට හිමිකම් කී අතර, ලකුණු 106 ක් ලබාගත් ගාල්ල දිස්ත්‍රික්කයට තෙවැනි ස්ථානය හිමිවිය.

ඔක්තෝබර් 31 සහ නොවැම්බර් 01 දෙදින පැවැති මෙවර ක්‍රීඩා උළෙලේ විශේෂත්වය වූයේ නව පිහිනුම් වාර්තා 21 ක් සහ නව තරග වාර්තා 09 ක් ඇතුළුව නව වාර්තා 30 ක් බිහිවීමය. එමගින් යෞවන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සතු ඉහළ දක්ෂතා සහ අනාගත ක්‍රීඩා ක්ෂේත්‍රය පිළිබඳ බලාපොරොත්තු යළිත් තහවුරු විය.

මෙවර ක්‍රීඩා උළෙලේ දක්ෂතම ක්‍රීඩිකාව ලෙස ගම්පහ දිස්ත්‍රික්කයේ ඒ.ඩබ්.ජී.ජේ.එස්. විජේතුංග සම්මාන දිනාගත්තාය. ඇය මීටර් 400 ඉසව්ව තත්පර 54.30 කින් නිම කරමින් එම ඇගයීමට පාත්‍ර වූවාය.

දක්ෂතම ක්‍රීඩකයා ලෙස කෑගල්ල දිස්ත්‍රික්කයේ එම්.ඩී. චතුරංග සම්මාන ලැබුවේ මීටර් 400 කඩුලු පැනීමේ ඉසව්ව තත්පර 50.06 කින් නිම කරමින් නව තරග වාර්තාවක් පිහිටුවමිනි.

සම ශූරතාව දිනාගත් ගම්පහ සහ මහනුවර දිස්ත්‍රික්ක දෙක සඳහා රුපියල් ලක්ෂ දෙක බැගින්ද, තෙවැනි ස්ථානය හිමිකරගත් ගාල්ල දිස්ත්‍රික්කයට රුපියල් ලක්ෂයක්ද ත්‍යාග වශයෙන් පිරිනැමිණි. දක්ෂතම ක්‍රීඩකයාට සහ ක්‍රීඩිකාවට රුපියල් ලක්ෂ දහය බැගින් පිරිනැමීම ද මෙහිදී සිදු කෙරිණි.






තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය, ජාතික තරුණ සේවා සභාව සහ ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය එක්ව සංවිධානය කළ මෙම ක්‍රීඩා උළෙලේ සමාප්ති උත්සවය සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය වෛද්‍ය නලින්ද ජයතිස්ස සහ තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය සුනිල් කුමාර ගමගේ යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

නියෝජ්‍ය අමාත්‍ය දිනිඳු සමන් හෙන්නායක, අමාත්‍යාංශ ලේකම් එස්. අච්චුදන්, ජාතික තරුණ සේවා සභාවේ සභාපති හා අධ්‍යක්ෂ ජනරාල් නීතිඥ සුපුන් විජේරත්න මහතා ඇතුළු නිලධාරීහු සහ ආරාධිතයෝ රැසක්ද ඊට එක්ව සිටියහ.

1986 වසරේදී ආරම්භ වූ ජාතික යෞවන ක්‍රීඩා උළෙල දශක ගණනාවක් පුරා ජාතික හා ජාත්‍යන්තර තලයට දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් රැසක් හඳුන්වා දුන් ප්‍රමුඛ වේදිකාවකි. මෙවර ක්‍රීඩා උළෙලද නව ක්‍රීඩා දක්ෂතා හඳුනා ගැනීමටත්, යෞවන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ඉදිරි ක්‍රීඩා ගමනට ශක්තියක් වීමටත් වැදගත් අවස්ථාවක් විය.

ශ්‍යාමලී ද සිල්වා,
ජාතික තරුණ සේවා සභාව

වලිසිංහ හරිශ්චන්ද්‍රතුමාගේ 'සිතියම් සහිත පුරා විද්‍යාව' නව මුද්‍රණය එළිදැක්වීම නොවැ. 7



වලිසිංහ හරිශ්චන්ද්‍ර තුමාගේ 'සිතියම් සහිත පුරා විද්‍යාව' කෘතියේ නව මුද්‍රණය එළිදැක්වීම මේ 7 වන දා (සෙනසුරාදා) ප.ව. 3.00ට කොළඹ 7, ජාතික පුස්තකාල ශ්‍රවණාගාරයේ දී සිදු කිරීමට නියමිත ය.

මූලසූනඃ

නැගෙනහිර, තමන්කඩුව දෙපළාතේ ප්‍රධාන සංඝනායක, ශාන්ති පදනමේ සභාපති, අනුරාධපුර පිච්ච මල් පූජාවේ නිර්මාතෘ, පූජ්‍ය කොටපළ අමරකිත්ති නාහිමිපාණෝ

මුඛ්‍ය අදහස් දැක්වීම්ඃ

මධ්‍යම සංස්කෘතික අරමුදලෙහි හා පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කළ, මහාචාර්ය ගාමිණී අධිකාරී මහතා හා ගෙවිඳු කුමාරතුංග

අනුරාධපුර උරුමය හා එය රැකුමට කළ අරගලය පිළිබඳ පළ ව ඇති විශිෂ්ට ම කෘතිය ලෙස සැලකෙන මේ ග්‍රන්ථය, 'හැම ගෙයකම තබාගැනීමට සැලැසිය යුතුය' යි ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහයන් ප්‍රකාශ කර ඇත.